# මලින් මලකට පැන යතී

1. සුවඳ පස්සේ දුවනවා
වනේ සැම තැන සොයනවා
පිපුණු මල් මත වහනවා
මිහිරි ගී හඬ නගනවා

2. තුඩින් මල් පැණි ඇද බොතී
ටිකින් ටික බී රඟ දෙතී
ගසින් ගසකට දිව යතී
මලින් මලකට පැන යතී

3. කිසි විටක අලස ව නැතී
මුළු දවස නිති වෙහෙසෙතී
නරන් මෙන් ගැටුමක් නැතී
එකා මෙන් සැම වැජඹෙතී

4. එක එකා ගොස් එක වගේ
රැස් කරන පැණි තුඩු අගේ
එකතු වන සැටි හරි අගේ
එතැන රජ දහනක් වගේ

5. අපට රජයක් තිබෙනවා
අපට රැජිනක් සිටිනවා
රැජින සම්පත් ගෙනෙනවා
සැවොම ඇය වෙත බැඳෙනවා

6. වැඩ කරන සැම එක් වෙතී
කල්මරන කිසිවෙක් නැතී
නරන් මෙන් බොරු නොකරතී
නියම රජයක් එහි ඇතී

7. රැස් කළත් වෙහෙස ව පැණී
වැඩ යෙදේ සොරකම් වැනී
මිනිස් අත් එතැනට පනී
මී වදෙන් ගැලුවා පැණී

*සමන් තිලකසිරි*
*- නව හෙළ ගී -*



## පැහැදිලි කිරීම්

**රජ දහන** - රාජධානිය
**අගේ** - කෙළවර
අගෙයි (හොඳයි)
**නරන්** - මිනිසුන්

## අවබෝධය සහ රස විඳීම

1. කවි පෙළ කීප වරක් තාලයට ගායනා කරන්න.
2. ගැළපෙන පිළිතුර තෝරා ලියන්න.
   (අ) මෙම කවි පෙළින් විස්තර වන්නේ
      i. සමනලයන් ගැන ය.
      ii. කුරුල්ලන් ගැන ය.
      iii. මීමැස්සන් ගැන ය.

(ආ) ඔවුන් දවස මුළුල්ලේ ම වැඩ කරන බව හැඟෙන කවි පදය නම්

i. මලින් මලකට පැන යතී
ii. මුළු දවස නිති වෙහෙසෙතී
iii. කිසි විටක අලස ව නැතී

(ඉ) **'සැවොම ඇය වෙත බැඳෙනවා'** යනුවෙන් අදහස් කරන්නේ

i. සියලු දෙනා ප්‍රධානියා අසල සිටින බව ය.
ii. සැම දෙනා ම ප්‍රධානියා ළඟ රැස් වී සිටින බව ය.
iii. සැම දෙනා ම සුහද බැඳීමකින් යුතු ව සේවය කරන බව ය.

3. මෙම රාජධානියේ දක්නට ලැබෙන ලක්ෂණ ඉදිරියෙන් ✓ ලකුණ යොදන්න. දක්නට නොලැබෙන ලක්ෂණ ඉදිරියෙන් X ලකුණ යොදන්න.

| | |
|---|---|
| වැඩ කරන විට දබර කිරීම .......................... | ........ |
| සහයෝගයෙන් වැඩ කිරීම .............................. | ........ |
| වැඩ කරන විට මිහිරි ලෙස නාද කිරීම........ | ........ |
| **කම්මැළි** වී සිටීම ........................................... | ........ |
| පාලකයා වෙත පක්ෂපාතී වීම ...................... | ........ |
| ඉතා සාමකාමී ව ජීවත් වීම ........................ | ........ |

4. මෙම කවි පෙළෙහි මිනිසුන් ගැන සඳහන් වන කවි පද උපුටා දක්වන්න.

5. **මිනිස් අත් එතැනට පනී**
**මීවදෙන් ගැලුවා පැණී**

මේ කවි පද දෙකෙන් අදහස් කරන දේ ඔබේ වචනයෙන් කියන්න. ලියන්න.

6. එක සමාන ව ශබ්ද වන වචන සොයන්න. ඒවා ලියන්න.

උදා:- බොති, දෙති

7. ඔබ වඩාත් ම ප්‍රිය කරන කවිය තෝරන්න. එය තාලයට ගායනා කර ලියන්න. එම කවියට ඔබ ප්‍රිය කිරීමට හේතුවක් කියන්න.

භාෂා ක්‍රියාකාරකම්

8. විරුද්ධ අර්ථය දෙන වචනයක් ලියන්න.

i. **මිහිරි** ........................ ii. **සුවඳ** ............................

iii. **පිපුණු** ........................ iv. **බොරු** ............................

v. **කෙළවර** ........................ vi. **අලස** ............................

8. රුස් කරන පැණි තුඩු **අගේ** 1

එකතු වන හැටි හරි **අගේ** 2

'**අගේ**' යන වචනය මෙහි අර්ථ දෙකකින් යෙදී ඇත.

එක එකින් හැඟවෙන අදහස ලියන්න.

i. අගේ 1 .................... අගේ 2 ..........................

9. වරහන් තුළින් ගැළපෙන වචනය තෝරා හිස් තැන් පුරවන්න.

i. කැලය ......................... (වණය, වනය)
තුවාලය .........................

ii. කාලය ........................ (කළ, කල)
කරන ලද ........................

iii. මරණයට පත් වූ ........................ (මල, මළ)
පුෂ්පය .........................

10. i. ක්‍රියා පද සමූහයක් ම මෙම කවි පෙළෙහි ඇත. ඒවා සොයා ලියන්න.

ii. කවියේ යෙදී ඇති ක්‍රියා පද ලියා පහත දැක්වෙන කවිය සම්පූර්ණ කරන්න.

*(මීමැස්සෝ)* තුඩින් මල් පැණි ඇද ...............
ටිකින් ටික බී රහ ...............
ගසින් ගසකට දිව ...............
මලින් මලකට පැන ...............

## පැවරුම්

1. මෙම කවි පෙළ තාල කීපයකට ගායනා කරන්න.
2. මීමැසි වදයක කොටසක් අඳින්න.
3. මේවා ගැන වැඩි දුර කරුණු සොයන්න.
   i. මීමැසි රාජධානියේ කටයුතු සිදු කෙරෙන ආකාරය
   ii. මීපැණි පාවිච්චි කෙරෙන අවස්ථා
4. පහත දැක්වෙන වචන යොදා අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය තනන්න.

| | |
|---|---|
| දන දණ | වල වළ |
| මරන මරණ | පැල පැළ |
| පහන පහණ | කල කළ |